යම් පිරිසකගේ කතාවක් ඔවුන් ඔහුට පිළිකුල් කරමින් සිටියදී ඇහුන්කන් දෙන්නට සලස්වන්නේද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහුගේ දෙකන් තුළට උණු කළ ඊයම් වක් කරනු ලැබේ.

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. “යම් පිරිසකගේ කතාවක් ඔවුන් ඔහුට පිළිකුල් කරමින් සිටියදී ඇහුන්කන් දෙන්නට සලස්වන්නේද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහුගේ දෙකන් තුළට උණු කළ ඊයම් වක් කරනු ලැබේ.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඒ හා සමානව ඉමාම් බුහාරි තුමාද වාර්තා කර ඇත]

යම් පිරිසකගේ කතාවක් ඔවුන් ප්රිය නොකරන තත්ත්වයේ ඔවුන්ගේ කතාවට සවන් දෙන්නන්හට දැඩි අවවාදයක් මෙම හදීසයේ සඳහන්ව ඇත. එය මහා පාපයන් අතරින් වූ නපුරු ගුණාංගයක් වන්නේය. එහි ප්රතිවිපාකය එම ක්රියාවේ වර්ගයෙන්ම පිහිටනු ඇත. කිසිවකුගේ කන් වැකෙන්නට සළස්වන කල්හි එහිදී ඔහු වේදනාවට ලක් වේ. එසේම ඔහුගේ කනට උණු කරනු ලැබූ ඊයම් වක් කරනු ලැබේ. එය ඔවුන් පිළිකුල් කරමින් සිටියදී නිවැරදි කරුණකට හෝ වලංගු නොමැති කරුණකට හෝ සවන් දෙන්නට සැලැස්වීම එක සමානය. සැබැවින්ම ඇතැම් මිනිසුන් වෙනත් අය ගැන සවන් දෙන්නට පිළිකුල් කරන බැවිනි. එම කතාවෙහි දොස් නැගීමක් වැරදි කීමක් හෝ බැණ වැදීමක් නොතිබුණ ද ඇතැමුන් ඇහුන්කන් දෙන්නට ප්රිය නොකරන බැවිණි.

http://www.sunnah.global/hadeeth/si/show/5374